අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ 2020 වසරට අදාළ නැවත සමීක්ෂණ ප්‍රතිඵල අද (25) දිනයේ දී නිකුත් කර තිබෙනවා.

විභාග කොමසාරිස් ජනරාල් එල්.එම්.ඩී. ධර්මසේන පැවසුවේ, මෙවර නැවත සමීක්ෂණයට ප්‍රතිඵල යොමු කිරීම සඳහා අයදුම්කරුවන් 32,528 දෙනෙකු ඉල්ලුම් කර ඇති බවයි.

එම ප්‍රතිඵල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන **www.donets.lk** හෝ **www.results.exams.gov.lk** වෙත පිවිසීමෙන් ලබාගත හැකියි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර විමසීම් සිදු කිරීමට අවශ්‍ය නම් පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල ශාඛාවේ දූරකථන අංක ලෙස **011-2784537, 011-27884208, 011-3188350 හෝ 011-3140314** යන අංක ඇමතීමෙන් තොරතුරු ලබාගත හැකියි.